# පුස්තකාලයේ පවතින දත්තපදනම් භාවිතය පිළිබඳව අධ්‍යයනයක් (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරෙනි)

යූ. ආර්. එන්. එස්. රණසිංහ[1]

## සංක්ෂේපය

පුස්තකාලය යනු, විශ්ව ඥාණයේ කෝෂ්ඨාගාරය ලෙස නිර්වචනය කළ හැකිය. විශ්වවිද්‍යාල පුස්තකාලයක මූලික අරමුණ වන්නේ, ඉගෙනුම් සහ පර්යේෂණ අවශ්‍යතා ඉටු කිරිමයි. ඒ අනුව, විශ්වවිද්‍යාල පුස්තකාලවල දැනුම අඩංගු මුද්‍රිත මාධ්‍යන්ට අමතරව තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග බිහි වූ දත්ත පදනම් ද විද්‍යාර්ථයන්ගේ භාවිතය සඳහා තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයක් වී ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, විද්‍යාර්ථයින් ඉගෙනුම් සහ පර්යේෂණ අවශ්‍යතා සඳහා කොතෙක් දුරට දත්ත පදනම්වල තොරතුරු ගවේෂණය කරන්නේ ද සහ මේවා අධ්‍යයනය කිරිමේ දී ගැටලුකාරී තත්ත්වයක් පවතින්නේ ද යන්න පිළිබඳව සොයා බැලීමය. මේ අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ හතරෙන් විද්‍යාර්ථයින් 150ක සසම්භාවි නියැදියක් මඟින් ප්‍රාථමික දත්ත ලබා ගත් අතර ඒ සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලදී. මෙම අධ්‍යයනය තුළින් පෙනී ගියේ, විද්‍යා හා සමාජ විද්‍යා පීඨයේ ඇතැම් අධ්‍යයන අංශ හැර අනෙක් පීඨ හා අධ්‍යයන අංශවල විද්‍යාර්ථයින්ට දත්ත පදනම් පිළිබඳව අවබෝධයක් නොමැති බවයි. පුස්තකාලයේ මුද්‍රිත මාධ්‍යය වෙත පමණක් විද්‍යාර්ථයින් නැඹුරු වූ ආකාරයක් හඳුනා ගත හැකි විය. මෙයට ප්‍රධාන හේතු සාධක ලෙස පුස්තකාලය විසින් සහ අධ්‍යයන අංශ විසින් විද්‍යාර්ථයින් දැනුවත් නොකිරීම සහ විද්‍යාර්ථයින් ද නව මාධ්‍යය ඔස්සේ බිහිවන දැනුම් මූලාශ්‍ර වෙත යොමු නොවීමට දරන අකමැත්ත යනාදිය දැක්විය හැක. මේ හේතුව නිසා විද්‍යාර්ථයින්ට තම අධ්‍යයන අවශ්‍යතා සඳහා නව්‍ය සහ කාලීන තොරතුරු ග්‍රහණය කරගැනීමේ හැකියාව නොලැබී ගොස් ඇත. විද්‍යාර්ථයින් අදාළ අධ්‍යයන අංශ විසින් දත්ත පදනම් පිළිබඳව දැනුවත් කිරිම, විෂය කරුණු, නිබන්ධ සහ විභාග ආදිය සඳහා දත්ත පදනම්වල අන්තර්ගත කරුණු ගවේෂණය අනිවාර්ය කිරීම සහ පුස්තකාලය විසින් දැන්වීම්, අත්පත්‍රිකා සහ නව මාධ්‍යය භාවිත කරමින් විද්‍යාර්ථයින් දැනුවත් කිරීම යනාදිය විද්‍යාර්ථයින් දත්ත පදනම් ගවේෂණය සඳහා යොමු කරවීමේ යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය. ඒ තුළින් විද්‍යාර්ථයින්ට ඉගෙනුම් සහ පර්යේෂණ ක්‍රියාවලිය සාර්ථක ලෙස ඉටු කර ගැනීමට මෙන්ම නව්‍ය තොරතුරු අධ්‍යයනය කිරීමට හැකි වේ.

**මුඛ්‍ය පද :** පුස්තකාලය, දත්ත පදනම්, විද්‍යාර්ථයා, තොරතුරු, අධ්‍යයන

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
nimasha ranashinghe.93@gmail.com